www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දකුනු ආසියානු නායකයෝ උත්සන්න වන ආතතීන්ගේ අඳුරු සෙවනැලි යටතේ හමු වෙති

## South Asian leaders meet under shadow of intensifying tensions

**සමන් ගුනදාස සහ කේ. රත්නායක විසිනි**
**2008 අගෝස්තු 7**

දකුනු ආසියානු රටවල් අටේ -- ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය, ශ්‍රී ලංකාව, ඇෆ්ඝනිස්ථානය, නේපාලය, මාලදිවයින සහ භූතානය -- දේශපාලන නායකයෝ පසුගිය සති අන්තයේ දී දකුනු ආසියානු කලාපීය සහයෝගිත සංවිධානයේ (සාක්) සමුලුව සඳහා ශ්‍රී ලංකාවේ අගනුවර වන කොලඹ දී හමු වූහ. කැමරා ඉදිරියේ අතට අත දීම් සහ සිනහ වීම් කෙරුනු නමුත්, ඉන්දියාව, ඇෆ්ඝනිස්ථානය හා පකිස්ථානය සම්බන්ධයෙන් තියුනු වන ආතතීන් ද ශ්‍රී ලංකාවේ යලි ඇරඹූ වර්ගවාදී යුද්ධය ද සියලු රටවල් මුහුන දී සිටින ගැඹුරු වන සමාජ හා ආර්ථික අර්බුදය ද විසඳලීමෙහි ලා ඔවුන් අතර සහයෝගයක් නොමැතිකම වසං කර ගැනීමට තිල ප්‍රකාශය අසමත් විය.

හමුව සිදු වූයේ කොලඹ දී මෙතෙක් පැවති දැවැන්තම ආරක්ෂක මෙහෙයුම මධ්‍යයේ ය. ශ්‍රී ලංකා ආන්ඩුව 19,000කට අධික හමුදා හා පොලිස් භටයන් නගරයේ යොදවා තිබූ අතර, විශාල ප්‍රදේශ අධි ආරක්ෂක කලාප ලෙස, එනයින් ගත් කල සාමාන්‍ය මහජනයා සඳහා තහනම් කලාප ලෙස, ප්‍රකාශය පත් කොට ප්‍රදේශ වට කොට සිදු කෙරුනු සෝදිසි මෙහෙයුම්වල දී දෙමල ජාතිකයන් දුසිම් ගනනක් අත් අඩංගුවට ගත්තේ ය.

ඉන්දියානු නාවික හමුදාව, සී කිං හෙලිකොප්ටර හා ඉහල පෙලේ හමුදා භටයන් සියගනනකගෙන් සමන්විත යුද නෞකා දෙකක් කොලඹට නුදුරු මුහුදේ නැංගුරම් ලා තැබී ය. තමිල්නාඩුවේ වෙරල ඔස්සේ පිහිටි මිලිටරි කඳවුරු අධි සීරුවෙන් තබා තිබූ බව ඉන්දියානු මාධ්‍ය වාර්තා කලේ ය. ශ්‍රී ලංකා ආන්ඩුව මෙන් ම නව දිල්ලිය ද මෙලෙස හමුදාව යෙදවීම යුක්තියුක්ත කලේ, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) ගරිල්ලාවරුන්ගෙන් එල්ල විය හැකි ත්‍රස්තවාදී ප්‍රහාරයක් වැලැක්වීමට අවශ්‍ය පියවරක් ලෙස ය. එහෙත් මෙම අත්‍යසමාන පියවර කලාපය තුල ඉන්දියාවේ මිලිටරි බලපරාක්‍රමය ප්‍රදර්ශනය පිනිස කෙරුනු බලය විදහා දැක්වීමක් ද විය.

සමුලුවේ දී, "ත්‍රස්තවාදී උවදුරට" එරෙහිව සටන් කිරීම අංක එකේ කර්තව්‍යය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. ත්‍රස්තවාදය සිය අපරාධ නීතියට ඇතුලු කර ගන්නා පනත් ගෙන එන ලෙසත් යෝජිත "ත්‍රස්තවාදයට එරෙහිව ජාත්‍යන්තර ප්‍රඥාප්තිය" ඉක්මන් කරන ලෙස එක්සත් ජාතීන්ගෙන් ඉල්ලා සිටින ලෙසත් ඒකාබද්ධ ප්‍රකාශය සියලු රටවලින් ඉල්ලා සිටියේ ය.

ප්‍රෝඩාකාරී "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගැන කෙරුනු අවධාරනය, විශේෂයෙන් ම, 2006 සිට එල්ටීටීඊයට එරෙහි යුද්ධයට දිවයින යලි ඇද දමා ඇති ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂට, තල්ලුවක් විය. රාජපක්ෂ ආන්ඩුව, "ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ" කඩතුරාව යටතේ සිදු කෙරෙන, සිය ගනනක් අතුරුදහන් හෝ ඝාතනය කරමින් මිලිටරි පිටුබලය සහිත ඝාතක කල්ලිවල මෙහෙයුම් සහ හිතුවක්කාරී රඳවා ගැනීම් ඇතුලු ප්‍රජාතන්ත්‍ර අයිතීන් විවෘතව උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු ය. එකඳු දේශපාලන නායකයෙක් වත්, වර්ගවාදී යුද්ධය යලි ඇරඹීම පිලිබඳව තියා මෙලෙස ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම් ගැන වත් කිසිදු විවේචනයක් කලේ නැත.

එලෙසම, ඇෆ්ඝනිස්ථානයේ පවත්වා ගෙන යන එක්සත් ජනපද නායකත්වයෙන් යුත් නව-විජිතවාදී මිලිටරි වාඩිලෑම ගැන ද මොනම විරුද්ධත්වයක් මතු කෙරුනේ නැත. ඒ වෙනුවට, කාබුල්හි එක්සත් ජනපද රූකඩ තන්ත්‍රයට නායකත්වය දෙන ඇෆ්ඝනිස්ථාන ජනාධිපති හමීඩ් කර්ෂායි යුක්තියුක්ත දේශපාලන නියෝජිතයකු ලෙස රැස්වීමට පිලිගන්නා ලදි. පකිස්ථානයේ දේශ සීමා අසල ප්‍රදේශවල සිට ඇෆ්ඝනිස්ථානය තුලට විනිවිදින එක්සත් ජනපද විරෝධී කැරලිකරුවන් නතර කිරීමට මීට වඩා ක්‍රියා කල යුතු යැයි පකිස්ථානයට තව දුරටත් බලපෑම් දමනු පිනිස අවස්ථාව යොදා ගැනීමට ඉන්දියානු අගමැති මන්මෝහන් සිං කර්ෂායි සමග එක් විය.

ඉන්දියානු ආරක්ෂක නියෝජිත ඇතුලු 54 දෙනෙකුට මරු කැඳවමින් ජුලි 7 දා කාබුල්හි සිය තානාපති කාර්යාලයට එල්ල වූ ප්‍රහාරය සැලසුම් කල බවට ඉන්දියාව පකිස්ථානයේ ඔත්තු ඒජන්සිය වන අන්තර්-සේවා ඔත්තු ආයතනයට (අයිඑස්අයි) නැවත නැවතත් චෝදනා කොට තිබේ. පකිස්ථානය එම චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත. ගින්නට තෙල් දමමින්, එක්සත් ජනපද ඔත්තු සේවා නිලධාරින් පසුගිය සතියේ කියා

සිටියේ, ඉන්දියානු තානාපති කාර්යාලයට එල්ල වූ ප්‍රහාරය අයිඑස්අයි සාමාජිකයන්ගේ සහයෝගය සහිතව තලිබාන් සංවිධානය විසින් සිදු කරන ලද බව යි.

ජුලි 28 දා, බෙදන ලද කාශ්මීරය මැදින් වැටී ඇති පාලන රේඛාව ඔස්සේ ඉන්දියානු හා පකිස්ථාන හමුදා අතර ගැටුම් පැන නැංගේ, එක සතියක් තුල තෙවන වතාවට ය. එහි දී එක් ඉන්දියානු සොල්දාදුවෙක් ඝාතනයට ලක් විය. ප්‍රහාරය ඇරඹූ බවට ආන්ඩු දෙක ම එකිනෙකාට චෝදනා කර ගත්හ.

පකිස්ථානය නමින් සඳහන් නොකර, සිං සමුලුවට මෙසේ පැවසී යː "අපගේ කලාපය තුල ත්‍රස්තවාදය සිය කැත හිස දිගටම ඔසවමින් සිටී." ඔහු කාබුල්හි ඉන්දියානු තානාපති කාර්යාලයට එල්ල වූ බෝම්බ ප්‍රහාරයට අවධානය යොමු කලේ ය. වොෂිංටනයෙන් එල්ල වන පීඩනයට ද මුහුන දී සිටින පකිස්ථාන අගමැති යුසුෆ් රුසා ගිලානි, සමුලුව පැවැත්වෙන අතරතුර දී සිං හමුවී බෝම්බ ප්‍රහාරය ගැන "පරීක්ෂන පැවැත්වීමට" පොරොන්දු වීම මගින් ආතතීන් සමනය කර ගැනීමට ප්‍රයත්න දැරී ය. වසර ගනනාවක් තිස්සේ දිගට ඇදෙමින් පවතින "සාම ක්‍රියාදාමය" දිගට ම පවත්වා ගෙන යාමට ද රටවල් දෙක ම එකග වූ බව ද ප්‍රකාශයට පත් කෙරුනි.

කෙසේ වෙතත්, ආතතීන් සරල ලෙස පහව නොයනු ඇත. දෙරට අතර එදිරිවාදුකම වනාහි, හින්දු-මුස්ලිම් වර්ගවාදී පදනමක් මත 1947 දී ඉන්දියානු උප-මහාද්වීපය ප්‍රතිගාමී ලෙස බෙදා වෙන් කිරීමේ ද රටවල් දෙකේ ම පාලක පන්තීන්ගේ භූ-දේශපාලන අභිලාෂයන්ගේ ද නිෂ්පාදිතයකි. කාබුල්හි ඉන්දියානු තානාපති කාර්යාලයට ප්‍රහාරය එල්ල කලේ කවුරුන් වුව ද ඉස්ලාමාබාද් පාලනය ඇෆ්ඝනිස්ථානය තුල වැඩෙන නව දිල්ලියේ ආනුභාවය දකින්නේ සිය ආරක්ෂාවට එරෙහි තර්ජනයක් ලෙස ය. ඔවුන්ගේ පාර්ශ්වයෙන්, ඉන්දියාව පකිස්ථානයට යටින් වල කපා, මධ්‍යම ආසියාව ද ඇතුලු කලාපය තුල සිය ආනුභාවය ප්‍රසාරනය කර ගැනීමට මාන බල යි.

ආතතීන් අවධාරනය කරමින්, නව දිල්ලිය අඟහරුවාදා චෝදනා කලේ අයිඑස්අයි ඉන්දියාවට ඉස්ලාම් අන්තවාදීන් 800ක් එවා ඇති බවයි. ඉන්දියානු දේශ සීමා ආරක්ෂක බලකායේ (බීඑස්එෆ්) ප්‍රධානි ඒ.කේ. මිත්‍ර හින්දු පත්‍රයට මෙසේ පැවසී යː "දේශ සිමා හරහා ත්‍රස්තවාදය දියත් කරනු පිනිස අවස්ථාව එලඹෙන තෙක් අයිඑස්අයි බලා සිටී."

ඇෆ්ඝනිස්ථානය ඇතුලත මිලිටරි වාඩිලෑමට එරෙහිව සටන් වදින කැරලිකරුවන්ට උඩ ගෙඩි දෙන බවට ඇෆ්ඝනිස්ථාන ජනාධිපති කර්ෂායි පකිස්ථානයට නැවත නැවතත් බැන වැදී තිබේ. තලිබාන් හා අල් ඛයිඩා සටන්කරුවන් මුලිනුදුරා දමනු වස් දේශ සීමාව අසල පිහිටි පකිස්ථානයේ ගෝත්‍රික ප්‍රදේශ තුලට ඇෆ්ඝනිස්ථාන මිලිටරිය එවන බවට ඔහු තර්ජනය කර ඇතැයි ද වාර්තා වේ.

කර්ෂායි සමුලුවේ දී මෙසේ ප්‍රකාශ කලේ ය. "ත්‍රස්තවාදී ප්‍රහාර හුදෙක් ඇෆ්ඝනිස්ථානයට හෝ ඉන්දියාවට පමනක් නොව, සමස්ත සාක් කලාපයට ම බලපාන ශීඝ්‍රයෙන් වැඩෙන තර්ජනයක් බවට පත්ව ඇත." කර්ෂායි රැස්වීම ආරම්භයේ දී ගිලානි සමග අතට අත දීම පවා ප්‍රතික්ෂේප කල අතර එහෙත් පසුව නිවේදනය කෙරුනේ, නායකයන් දෙපල "ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ" දී සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ වූ බව යි.

සාක් සමුලුව හමාර වීමත් සමග ම, කර්ෂායි ඉන්දියාව සමග සබඳතා තව දුරටත් ශක්තිමත් කරනු පිනිස සඳුදා නව දිල්ලිය බලා ගියේ ය. කර්ෂායි හමුවීමෙන් පසුව, සිං ප්‍රකාශ කලේ කාබුල්හි ඉන්දියානු තානාපති කාර්යාලයට එරෙහි ප්‍රහාරය දෙරට අතර "මිත්‍රත්වයට එල්ල වූ ප්‍රහාරයක්" ලෙස යි. දැනටමත් වෙන් කර ඇති ඩොලර් මිලියන 750ට අමතරව, ඇෆ්ඝනිස්ථානයට තවත් ඩොලර් මිලියන 450ක ආධාර ලබා දෙන බව ද ඔහු නිවේදනය කලේ ය.

දෙරට අතර ආරක්ෂක සබඳතා වැඩි දියුනු කිරීම පිලිබඳ සාකච්ඡා පැවති බව ද කර්ෂායි ඇගවී ය. *ටයිම්ස් ඔෆ් ඉන්දියා* සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඔහු මෙසේ පැවසී යː "ඔවුන්ගේ ආරක්ෂක ආයතනවල විවිධ ක්ෂේත්‍ර තුල අපගේ නිලධාරින් පුහුනු කිරීමෙහි ලා ඇෆ්ඝනිස්ථානයට බොහෝ දේ දෙන්න ඉන්දියාවට පුලුවන්."

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" මෙන් ම, කලාපය පුරා පවතින ගැඹුරු වන සමාජ හා ආර්ථික ගැටලුවලට ආමන්ත්‍රනය කිරීම පිලිබඳ හිස් පොරොන්දු මාලාවක් ද සමුලු ප්‍රකාශයට ඇතුලු විය. රැස්වීමට සහභාගි වූ සියලු ම ආන්ඩු, ශීඝ්‍රයෙන් නැගෙන ආහාර හා ඉන්ධන මිල ගනන් ද පිරිහෙන ජීවන මට්ටම් ද හේතු කොට ගෙන වැඩෙන මහජන අසන්තෘප්තියට මුහුන දී සිටිති.

දකුනු ආසියානු නිදහස් වෙලඳ ගිවිසුමක් (සෆ්ටා) ස්ථාපිත කර ගැනීම වේගවත් කිරීමට සාක් ප්‍රකාශය යලිත් වරක් පොරොන්දු විය. මහ ව්‍යාපාරිකයන්ගේ හා ජාත්‍යන්තර ආයෝජකයන්ගේ ඉල්ලීම් තිබිය දී ම, කලාපය තුල වඩා සමීප ආර්ථික සබඳතා පිලිබඳ සාකච්ඡා එදිරිවාදුකම් හා ආතතීන් මගින් ඉරිතලා ගොස් තිබේ. සෆ්ටා සඳහා වන ඉලක්කය 2012 වන විට සම්පූර්න කිරීමට නියමිතව තිබෙන නමුත් මූලික බාධක එලෙසම පවතී.

ඉකොනමිස්ට් මෙසේ අදහස් දැක්වී යː "සාක් සංවිධානය සිය ප්‍රධාන කර්තව්‍යයේ දී, එනම් කලාපීය ආර්ථික ඒකාග්‍රකරනය දිරිගැන්වීමේ දී, නාටකාකාර ලෙස අසාර්ථක වී ඇත්තේ මන් ද යන වග පැහැදිලි කිරීමෙහි ලා මෙය (එදිරිවාදුකම) බොහෝ දුරක් යයි.

පසුගිය වසරේ දී නිකුත් කරන ලද ලෝක බැංකු වාර්තාවකට අනුව, ලෝකයේ අඩුවෙන් ම ඒකාග්‍රිත කලාපය දකුනු ආසියාව යි. සාක් සාමාජිකයන් අතර වෙළඳම ඔවුන්ගේ ඒකාබද්ධ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2කටත් වඩා අඩු ප්‍රමානයක් විය."

"දරිද්‍රතාව තුරන් කිරීම" ද බංග්ලාදේශයේ පිහිටුවනු ලබන කලාපීය ආහාර බැංකුවක් ස්ථාපිත කිරීම ද පිනිස මූනිච්චාවට කෙරුනු කැඳවුමක් ද සමුලු ප්‍රකාශයට ඇතුලත් ය. ආහාර බැංකුවක් පිළිබඳ යෝජනාව මුලින්ම කරන ලද්දේ 2005 සාක් සමුලුවේ දී ය. තුන් වසරක් ගත වී ඇතත් එය තවමත් පවතින්නේ සැලසුම් මේසය මත ය. එය අවසානයේ ස්ථාපිත කෙරුනා වුනත් එම ආහාර බැංකුව උප-මහාද්වීපය පුරා සිටින කෝටි සංඛ්‍යාත මහජනයා මුහුන දෙන මංමුලා සහගත තත්වය සමනය කිරීමෙහි ලා කොහෙත් ම සමත් නොවනු ඇත.

දකුනු ආසියාවේ ඒකාබද්ධ ජනගහනය ලෝකයේ මුලු ජනගහනයෙන් සියයට 25ක් නැතහොත් බිලියන 1.5ක් වේ. එයින් සියයට 40ක් පමන ජීවත් වන්නේ දිනකට ඩොලර් 1කට අඩු ආදායමක් ලබන දරිද්‍රතා කොන්දේසි තුල ය. ලෝක බැංකුවට අනුව, සියයට 75ක් ජීවත් වන්නේ දිනකට ඩොලර් 2කට වඩා අඩු ආදායමක් යටතේ ය.

දකුනු ආසියාව අඩු බර සහිත ජනයාගේ ලෝකයේ ඉහල ම අනුපාතය දරයි. එනම් මුලු ජනගහනයෙන් සියයට 42කි. ඉන්දියානු ජනගහනයෙන් සියයට 43ක් මන්දපෝෂනයෙන් පෙලෙයි. රටේ වයස අවුරුදු පහට අඩු ලමුන්ගෙන් සියයට 13.5ක් නිදන්ගත මන්දපෝෂනයෙන් ද සියයට 30ක් රක්තහීනතාවයෙන් ද පෙලෙන බව සමුලුව ආසන්නයේ දී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යංශය පිලිගත්තේ ය.

පිම්මේ ඉහල නගින ආහාර හා ඉන්ධන මිල ගනන්වල ප්‍රතිඵලයක් ලෙස ජීවන මට්ටම් පිරිහෙමින් පවතී. දැවැන්ත මිලිටරි වියදම් නැගෙන මිල ගනන්වලට සැලකිය යුතු ලෙස බලපා ඇති ශ්‍රී ලංකාවේ දී, උද්ධමන අනුපාතිකය සියයට 30ක ඉහල අගයක පවතී. පකිස්ථානයේ, ඉන්දියාවේ, බංග්ලාදේශයේ හා නේපාලයේ උද්ධමනය පිලිවෙලින් සියයට 21, 12, 10 සහ 11 වේ. කෙසේ වෙතත්, ආහාර මිල ගනන් ඊට වඩා වේගයෙන් ඉහල යන්නේ, සියයට 30 සහ 60 අතර අනුපාතිකයන්ගෙනි.

මෙම රටවල පාලක ප්‍රභූහු, සමාජ අර්බුදය විසඳලාමෙහි ලා අසමත්ව, වඩ වඩා ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලන රූපයන්ගේ පිහිට සොයති. බංග්ලාදේශය පාලනය කරනු ලබන්නේ මිලිටරියේ පිටුබලය ලබන තන්ත්‍රයක් මගිනි. නේපාලයේ හා පකිස්ථානයේ පවතින්නේ ඡන්දයෙන් තේරී පත් වූ ඉතා දුර්වල හා අස්ථායි ආන්ඩු ය. එම දෙරටේ ම මිලිටරිය, බලය අල්ලා ගැනීමේ තර්ජනය මතු කරමින්, පසුබිමේ රැඳී සිටී. ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ඊනියා ප්‍රජාතන්ත්‍ර පාලන තන්ත්‍රයෝ විරුද්ධත්වය හා සමාජ අසහනය මඩිනු වස් පොලිස්-රාජ්‍ය විධික්‍රම මත වාරුවෙති.

ආකාරගත ස්වාධීනත්වයෙන් වසර 60ක් ඇවෑමෙන්, කලාපය පුරා පාලක පන්තීන්, ජනගහනයේ අති මහත් බහුතරයේ මූලික ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් හෝ සමාජ අවශ්‍යතා සපුරාලීමෙහි ලා සිය ඓන්ද්‍රීය නොහැකියාව ඔප්පු කර තිබේ. එක් එක් රටේ ආන්ඩුව ක්‍රියා කර ඇත්තේ, අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී ක්‍රියාකාරකම්වලට විරුද්ධ වීමට නොව, කලාපයේ ආනුභාවය සඳහා තරඟ වදින මහ බලවතුන්ගේ, අන් සියල්ලටමත් වඩා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ, පිටුබලය සහතික කර ගැනීම පිනිස එකිනෙකා සමග තරඟ වැදීමට යි. මෙම එදිරිවාදුකම, විශේෂයෙන් ම ඉන්දියාව හා පකිස්ථානය අතර පවත්නා ප්‍රතිවාදිත්වය, කලාපයේ තවත් විනාශකාරී යුද්ධයක් ඇවිලීමේ තර්ජනය දිගට ම මතු කරයි.

මෙම සන්දර්භය තුල, සාක් සමුලුව, වඩා සමීප සබඳතාවක් සඳහා මාධ්‍යයක් වනවා නොව, ආර්ථික හා භූලෝපායික ආනුභාවය සඳහා තරඟ වදින තවත් පොර පිටියක් විය.

© www.wsws.org